## ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය - 2015

---

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ 2015 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනතේ 25(3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්වය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 සම්බන්ධිත පාර්ශවයන් සමඟ ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

1984 අංක 18 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත අනුව රජයේ මුද්‍රණාලයාධිපතිවරයා නිල බලයෙන් ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාලක මණ්ඩලයට පත්වන අතර පාලක මණ්ඩලයේ එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස අමාත්‍යවරයා විසින් පත් කිරීමට බලය ලබාදී ඇත. කෙසේ වුවද රජයේ මුද්‍රණාලයාධිපතිවරයා එහි අරම්භයේ සිටම ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ සභාපතිවරයා ලෙස පත් කර තිබුණි. විධිමත් ගිවිසුමක් නොමැතිව හා කිසිදු ගෙවීමකින් තොරව ආයතනය පවත්වාගෙන යාමට අවශ්‍ය ඉඩ පහසුකම්, විදුලිය හා ජලය රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්නා අතර ගාස්තු අය කිරීමකින් තොරව දෙපාර්තමේන්තු නිලධාරීන් පුහුණු කිරීම ආයතනය විසින් කරනු ලැබේ.

#### 2.2.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිතයෙහි 17 කොටස අනුව 2013 සැප්තැම්බර් 18 දින තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් විසින් ආයතනයට පවරා දී තිබු හෙක්ටයාර් 0.1012 (පර්චස් 40ක් පමණ) ඉඩමේ වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කර නොතිබුණි. මෙම ඉඩම හා රජයේ මුද්‍රණාලය පිහිටා ඇති සම්පූර්ණ ඉඩම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය යටතට පවරා ගෙන ඇති බැවින් මූල්‍ය ප්‍රකාශනවල වත්කමක් ලෙස දක්වා නොමැති බව සභාපතිවරයා විසින් විගණනය වෙත දන්වා තිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

ණයගැති හානිකරණය සඳහා වෙන්කිරීම, ණය අයනොවීමේ සම්භාවිතාවය මත සිදුවිය යුතු වුවත්, ඊට අදාල ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කර නොතිබුණි. එසේ වුවද මූල්‍ය ප්‍රකාශන තුළ ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට හිඟහිටි මුළු ණයගැති ශේෂය සඳහාම ණයගැති හානිකරණය සඳහා වෙන්කර තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනට ණයගැති ශේෂය රු.4,612,100 ක් වූ අතර 2015 දෙසැම්බර් 31 දිනට එම ශේෂය රු.7,039,574 ක් වුයෙන් ණයගැති ශේෂය සියයට 52 කින් වර්ධනය වී තිබුණි.

### 2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

නව ගොඩනැගිල්ලේ සැලැස්ම සකස් කිරීම සඳහා 2009 වර්ෂයේදී අත්තිකාරම් ලෙස ගෙවා තිබූ රු.227,370 ක් පාලක මණ්ඩල අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ දී වියදමක් ලෙස කපාහැර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.7,137,956 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.6,675,037 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.462,919 ක වර්ධනයක් ඇතිවී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ වියදම රු.1,022,855 කින් වැඩිවී තිබුණද ආදායම රු.1,485,774 කින් වැඩිවී තිබීම ඉහත වර්ධනයට හේතු වී තිබුණි.

ඉකුත් වර්ෂවල මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2011 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා අඛණ්ඩව මූල්‍ය අතිරික්තයේ වර්ධනයක් පැවති නමුත් 2014 වර්ෂයේ අතිරික්තයේ අඩුවීමක්ද, 2015 වර්ෂයේ නැවත අතිරික්තයේ වැඩිවීමක්ද පෙන්නුම් කෙරුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂය සැලකිල්ලට ගැනීමේදී ආයතනයේ දායකත්වය 2011 සිට 2013 දක්වා වර්ධනය වී තිබුණද 2013 සිට 2015 දක්වා පිළිවෙලින් රු. 12,488,771ක්, රු. 10,961,081 ක් හා රු.11,717,050 ක් වූයෙන් 2013 වර්ෂයේ සිට එය උච්චාවචනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

1984 අංක 28 දරන ශ්‍රී ලංකා මුද්‍රණ ආයතන පනත අනුව ආයතනයේ අරමුණු පහත පරිදි විය.

(අ) මුද්‍රණ ක්ෂේත්‍රයෙහි දැනට සේවා නියුක්ත තැනැත්තන් පුහුණු කිරීම හා සහතික ප්‍රදානය, මුද්‍රණ තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීම.

(ආ) නව විෂය මාලා, ශිල්පී ක්‍රම කාර්යාවලි පිළිබඳ වාර ප්‍රවෘත්ති පත්‍රිකා හෝ වෙනත් ප්‍රකාශන නිකුත් කිරීම.

(ඇ) මුද්‍රණ කර්මාන්තයට සම්බන්ධ වෘත්තීය ප්‍රදර්ශනවලට සහභාගී වීම, එතෙර පුහුණුවීම් සමාරම්භ කිරීම හා හුවමාරු ක්‍රමයක් මත අන්‍යෝන්‍ය පුහුණුව ලබාදීම හා ලබා ගැනීම.

ඉහත අරමුණු අතුරින් මුද්‍රණ ක්ෂේත්‍රයෙහි දැනට සේවා නියුක්ත තැනැත්තන් හා ආධුනිකයන් පුහුණු කිරීම හා සහතික ප්‍රදානය, මුද්‍රණ තාක්ෂණය හා කළමනාකරණය පිළිබඳ පුහුණු පාඨමාලා සංවිධානය කිරීමේ අරමුණ ඉටුකර ගැනීම කෙරෙහි පමණක් අවධානය යොමුකර තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය සඳහා ආයතන කාර්යය පරිපාටිය හා මූල්‍ය කාර්යය පරිපාටිය රු.56,725 ක් වැය කර 2009 වර්ෂයේදී පිළියෙල කර අනුමැතිය සඳහා අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර තිබුණද 2016 අප්‍රේල් වන විටද අනුමැතිය ලබා දී නොතිබුණි.

(ආ) 2014 හා 2015 වර්ෂවල ආයතනය විසින් පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීම සඳහා විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කර නොතිබුණි.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

2015 දෙසැම්බර් 31 දිනට ආයතනය විසින් උපයනු ලබන ආදායම් රු.62,923,559 ක් ආයතනයේ අරමුණු ලඟා කර ගැනීමට භාවිතා කිරීමකින් තොරව ආයෝජනය කර තිබුණි.

**4.4 කාර්ය මණ්ඩල පරිපාලනය**

ආයතනයේ අනුමත සේවක සංඛ්‍යාව 13 ක් වූ අතර තථ්‍ය සේවක සංඛ්‍යාව 11ක් වුයෙන් පුරප්පාඩු 02 ක් පැවතුණි. සමාලෝචිත වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරු සහ උපදේශකවරු 32 දෙනෙකු පුහුණු කටයුතු සඳහා සේවයේ යොදවාගෙන තිබූ අතර ඒ සඳහා ස්ථිර කාර්ය මණ්ඩලයක් බඳවා ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

සංයුක්ත සැලැස්මේ ඇතුළත් නව ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම, විදේශ සේවා නියුක්තිය සඳහා ජාත්‍යන්තර වෘත්තීය සුදුසුකම්වලින් හා බහු හැකියාවන්ගෙන් යුත් ශ්‍රම බලකායක් සංවර්ධනය කිරීම හා ආයතනය සඳහා නව සංවිධාන සැලැස්මක් ස්ථාපිත කිරීම හා ඒ සඳහා අවශ්‍ය මානව සම්පත් ලබා ගැනීම සඳහා වූ කාර්යයන් ඉටුකර නොතිබුණි.

**5.2 ක්‍රියාකාරී සැලැස්ම**

ආයතනය පවත්වන පාඨමාලාවලට අදාළව බඳවාගැනීම්, පාඨමාලා හැරයාම් සහ පාඨමාලා සම්පූර්ණ කිරීම් පිළිබඳ විස්තර පමණක් ඇතුළත් සැලැස්මක් සකස්කර තිබුණද එකී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛ අංක PFD/RED/01/04/2014/01 ප්‍රකාරව ආයතනයේ අරමුණු ඉටුකර ගැනීමට අදාළ ප්‍රගතිය දැක්වෙන පරිදි පිළියෙල කර නොතිබුණි.

**5.3 අභ්‍යන්තර විගණනය**

2011 දෙසැම්බර් 23 දිනැති අංක DMA/06 දරන කළමණාකරණ විගණන චක්‍රලේඛය පරිදි ආයතනයේ කටයුතු කාර්යක්ෂමව හා ඵලදායීව සහ ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම ක්‍රියාවේ යොදවන බවට තහවුරුකර ගැනීම සඳහා අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**5.4 අයවැය පාලනය**

සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේ දී සියයට 20 සිට සියයට 446 දක්වා විචලනයන් වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමණාකරන පාලන කාරකයක් ලෙස උපයෝගී කර ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**6 පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර අධිකාරියේ සභාපතිවරයාගේ අවධානයට යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ආදායම් පාලනය | පාඨමාලා ගාස්තු සංශෝධනය කිරීම සඳහා ක්‍රම වේදයක් නොතිබීම හා අයකර ගැනීම සඳහා ප්‍රමාණවත් පියවර නොගැනීම. |
| (ආ) ණයගැති පාලනය | බොල්ණය වෙන් කිරීමේ විධිමත් ක්‍රම වේදයක් නොතිබීම. |
| (ඇ) වියදම් පාලනය | ආයතනය පවත්වා ගැනීමට අදාල වියදම් හඳුනා ගැනීමේ ක්‍රමවේදයක් නොතිබුණි. |